43 වන පිටෙන්

වස්තූන් භාවිත කරන ලදි. මූලිකව යුද්ධ කාර්යයට පමණක් නොව පණිවිඩ හුවමාරු කිරීම සඳහා ද දුනු ශිල්පීන් සම්බන්ධ කර ගැනින. දුන්නෙන් හී විදිනාකාරය පූජාවලියේ මෙලෙස විස්තර කරයි.

දුන්නතක් ගෙන්වා යටි පිලාව වම්පස මාපට ඇඟිල්ලෙහි නිය පිට තබා දුන්න (පූජාවලිය 146).

පැරණි ලංකාවේ චතුරංගනී සේනාවට අමතරව විශේෂ දුනු සේනාංක පැවති බව පෙනේ. පරාක්‍රමබාහු රජු සතු රාත්‍රීකාලයේ සඳ එළියට අනුව සතුරාට විදිය හැකි චන්ද්‍රාලෝක ධනුර්ධර් නම් රෙජිමෙන්තුවක් මෙන්ම තීක්ෂණ වේධී, කෂණවේධි යනාදි දුනු රෙජිමෙන්තු තිබුණි. මහනුවර යුගයේ උඩරට සේනාව සතුව දුනුකාර නම් රෙජිමේන්තුවක් පැවති බවත් එය මෙහෙයවන ලද්දේ දුනුකාර ලේකම් නම් නිලදරුවා අතිනි. මෙම රෙජිමේන්තුව පිහිටුවන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසිනි. මීට අමතරව පොළොන්නරුව සහ මහනුවර යුගවල දී දුණු සේනාංකයට ආදිවාසීන්ද අනුයුක්ත කෙරිණි. ඒ ඔවුන්ගේ දඩයම් කිරීමේ සහජ දක්ෂතාවය තිබෙන නිසාවෙනි. දඹදෙණිය යුගයේ ද 900ක දුණු සේනාංකයක් පැවති බව දඹදෙණි අස්න මහත් අබිරුචියෙන් වාර්තා කරයි. ඉපැරණි දුනු සෙබළු යුද්ධයෙන් පසුව ආගමික ස්ථානවලට යම් යම් පරිත්‍යාග බරමින් දැහැමිව ජීවත් වූ බවට සාධක අම්පාර මුල්ලිකුලම් මලේ ප්‍රදේශයෙන් හමු වී ඇති ශිලාලේඛන තුනකින් අනාවරණය වෙයි. එවායේ අන්තර්ගත වන්නේ දුනුසෙබල ගුත්ත තම්ත්තෙකු විසින් මහා සංඝරත්නයට පූජා කළ ස්තූපයක්, විහාරයක් සහ ලෙනක් පිළිබඳ විස්තරයකි.

## දුනු සහ ඊතල

යුද්ධ සඳහා පුහුණු කරන ලද දුනුවායකු සතු ප්‍රමුඛතම ආයුධ ද්විත්වය වන්නේ දුන්න හා ඊතලයයි. අභිධානප්පදීපිකාවේ ඉස්සාස, ධනු, කොදණ්ඩ, සරාසන, චාප යනුවෙන්ද සර,



Mr. Charles Stevens meets some Veddahs and conciliates them.
The Graphic, November 26, 1887.

පත්ති, සාධක, බාණ, කාණ්ඩ, මුසු, බුරුප්ප, තේජස යන නමින් ඊතලය ද හඳුන්වා ඇත. මධ්‍ය කාලීන යුගයේ රචිත දඹදෙණි අස්නට අනුව යොන් දුනු, තත්තාරි දුනු, ගල් දුනු, මාර දුනු, ඕලක්කම දුනු, කළුදුනු, කළුවැල් දුනු, නඩවැල් දුනු, නඩහඩු දුනු, මැඩගු දුනු, මිටි දුනු, උස් දුනු, චන්ද්‍රාවංක දුනු, තිවංක දුනු යනාදී වශයෙන් දුනු වර්ග 21ක ලැයිස්තුවක් දක්වා ඇත. නියමාකාර දුන්න මාළුවකුගේ පිටේ හැඩයට සමාන විය. මූලිකවම දුන්න අර්ධ කවාකාරව නවා කෙලවර දෙකට අඟලක් පමණ මෙහායින් කට්ටක් හෝ මැලියම් මිශ්‍රිත වරපට හෙවත් දුනුදිය සවිකර ගැනීම සඳහා ලෝහමය මුද්දක් එකතු කරන ලදි. දුනුදිය හෙවත් දුනු ලනුව සඳහා නුග පට්ට, ගෝණ බඩවැල්, නියදි, අරළු යනාදි ශාකමය සහ මාංශමය ද්‍රාව්‍ය යොදාගත් අතර දුනු ලීය සඳහා කළු, කළුවැල්, වේවැල්, සින්දුරම්, යනාදි ගස්වර්ග යොදා ගන්නා ලදි. ඊතලය සඳහා ගැටවණ, කොබ්බෑ, කැති දෙමට, වේවැල්, කුකුරුමහන් සහ කරඩු වැනි සැහැල්ලු දැව වර්ග භාවිත කෙරිණි. ඊ හිස් (Arrow head) සඳහා යකඩ, සත්ව අට කටු හා තියුණු ලී ප්‍රයෝජනයට ගැණිනි. තවද යුධ ඇතුන්, අශ්වයන් ඝාතනය කිරීම සඳහා ඉපැරණි සිංහල දුනුවායන් ගෝකණ්ණ නම් විශේෂ ඊතලයක් නිපදවා ඇති දුනු, ඊතල, ඊ කොපුව යන උපකරනවලට අමතරව දිගු කාලීන සටන් වළට අවශ්‍ය වන සතුරු හී ප්‍රහාරයකින් ගැලවිය හී අඩු, පලස්, සත්ව හම්න් කරන ලද ශරීරාවරණ, හී ප්‍රහාරයකින් තුවාල ලබන්නන් සුවපත් කළ හැකි බෙහෙත් යනාදීය ශ්‍රී ලංකේය දුනුවායා විසින් භාවිත කරන ලදි. හීයේ පසු කොණට හංස, කපුටු හෝ මොණර පිහාටු යෙදූ බව කාලිදාසගේ රඝුවංශය සඳහන් කරයි. බුරුමය, සියම, කාම්බෝජය, ශ්‍රී විජය අධිරාජ්‍යය වැනි අග්නිදිග ආසියාතික රටවල විෂ පෙවූ හී තල පාවිච්චි කළ ද මෙරැට්යන් ඒවා භාවිත කළේ නැත. මහනුවර යුගයේ දී ත්‍රිවිධ යුරෝපියානු ආක්‍රමණිකයන්ගේ වෙඩි බෙහෙත් තොග පුපුරුවා හැරීම සඳහා උඩරට සෙබළු විසින් ඇවිලෙන ගිනි කවන ලද කරුංකා ගෙඩි සවි කරන ඊතල විද්ද බව ජනශ්‍රැතියේ සඳහන් වෙයි. උක්ත සාධක වලට අනුව පෙනීයන්නේ ශ්‍රී ලාංකේය දුනුවායා අතින් යුද්ධ සේවයේ දී විශිෂ්ට කාර්යය භාරයක් ඉටු කළ බවයි.

www.archaeeology.lk/sinhala

Mariane Fernando
Member ACA & Counsellors Victoria Inc.
Trained by Transgender Victoria

Offering counselling services for:
- Relationship
- Addiction
- Grief and loss
- Family
- Anger management
- Anxiety and stress

First session free

Medibank Private Health Fund rebates may be available

9798 7005 or 0423 364 618

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com



සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්